ගඳ විඳමින මතක සුවඳ

23

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට

1971 කැරැල්ලේදී ව්‍යාපාරය (ජ.වි.පෙ.ට) සැබෑ ලෙසම ද්‍රෝහිකම් කළවුන් හා විවිධ හේතු සාදක මත ව්‍යාපාරය විසින් ද්‍රෝහීන් යයි හංවඩු ගසන ලද පුද්ගලයින් පොග ගණන් සිටියහ. ඉන් ඇතැමෙක් වර්තමානයේ පවා ජ.වි.පෙ. ට ද්‍රෝහිකම් කරමින් සිටිති. එහෙත් විස්මයට කාරණය නම් 1987 - 89 දේශප්‍රේමී අරගලයෙන් පසුව ද්‍රෝහීන් වශයෙන් හැඳින්වෙන කිසිවෙක්ම නොවීමයි.

71 කැරැල්ලෙන් පසුව එවකට සිටි පාලකයන් විසින් දූෂණයට ලක්කරන ලද නීතියක් හෝ රටේ පැවැති බැව් පෙනී ගියේ අපරාධ යුක්ති විනිශ්ය කොමිෂන් සභා පනත නම් වූ විශේෂ පනතක් හා කොමිසමක් මගින් රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණකරුවන් ලෙස 41 දෙනෙකු නම්කොට, රාජ්‍ය විරෝධී අප්‍රේල් කැරැල්ල නමින් මහ නඩුවක් ඇසූ නිසාය.

එහෙත් 1987 - 89 දේශප්‍රේමී අරගලය පවතින අතරතුර ද ඉන් පසුව ද පෙනී ගියේ ශ්‍රී ලංකාව නීතියක්, අධිකරණයක්, යුක්තියක් නොමැති රටක් වශයෙනි. රාජ්‍ය බලය පැහැර ගැනීම සඳහා ඒ සා දැවැන්ත කැරැල්ලක් දියත් විත් වෝදනා ඉදිරිපත් කොට, නඩුවක් ගොනුකොට, අධිකරණයකට ඉදිරිපත් කිරීමට කිසිම වුදිතයෙකු නොවී ජනතා විමුක්ති පෙරමුණේ ඉහළම නායකයන් දෙදෙනා වන එනම් ජ.වි.පෙ. සභාපතිවරයා හා ලේකම්වරයා වන රෝහණ විජේවීර හා උපතිස්ස ගමනායක යන දෙදෙනා හමුදා අත්අඩංගුවට පත්වූයේ මහා පාවදීමකින් බව අවිවාදිතය. එම පාවා දෙන්නා වූයේ කවරෙක්ද ? ප්‍රශ්නය මතුවන්නේ මෙන්න මෙතනදී ය.

විජේවීර, ගමනායක යන සහෝදරවරුන් හමුදා අත්අඩංගුවට පත් වූයේ කෙසේද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ අති බහුතර

ගමනායක

සමාජිකයන්ට අද පවා පැහැදිලි, නිශ්චිත පිළිතුරක් තිබේද ? නැත. පොදුවේ ගත් කළ වැඩි දෙනෙකු දන්නේ ඩී.එම්. ආනන්ද නම් වූ නායකයා විසින් ඔවුන් දෙදෙනා හමුදාවට පාවාදුන් බවකි.

හමුදා වධකාගාරය දරුණු වධ බන්ධනවලට ලක්කරන ලද එච්.බී. හේරත් විසින් තම නායකයන් දෙදෙනා පාවාදුන් බවට ද කථාවක් ඇත. රෝහණ සහෝදරයා අත්අඩංගුවට ගැනීමට ගිය හමුදා කණ්ඩායම සමග රැගෙන යනු ලැබූ එච්.බී. හේරත් මගදී හිත වෙනස් කරගෙන තම නායකයා පාවා දිය නොහැකි යයි හඬා වැටුණ බවද එහෙත් අවසානයේ උලපනේ සාන්ත මේරි වත්තට ඔහු මග පෙන්වූ බවට ද පුවතක් තිබේ. මෙම පුවත විශ්වාස කළ නොහැකි හේතුවක් තිබේ වර්තමානයේ ජ.වි.පෙ. විසින් පවත්වන 'ඉල්මහ සමරු' වලදී එච්.බී. හේරත් ද සැමරෙයි. ඔහු ගැන සැමරුම් සටහන් ඇති ජ.වි.පෙ. ජාත්‍යන්තර ප්‍රකාශන තිබේ. එච්.බී. හේරත් ඒ සා දැවැන්ත ද්‍රෝහිකමක් කළේ නම් ඔහු සැමරුම්වලට ලක්වෙතැයි සිතිය හැකිද?

එහෙත් ඩී.එම්. ආනන්ද සැමරුවලට ලක් නොවෙයි. ඒ අරුතින් මේ වාර්තාගත පාවාදීම කරන ලද්දේ ඔහු විසින් යයි නිගමනයකට එළඹිය හැකි ය. එසේ වුව ජ.වි.පෙ. විසින් ඩී.එම්. ආනන්ද ද්‍රෝහියෙකු වශයෙන් නොහඳුන්වන අතර ඔහු කෙරෙහි සානුකම්පිතව බලන බවක් ද හැඟීයයි.

විජේවීර

මේ පාවාදීමේ කතාන්දරය අතුළත මහා අතිරංගසක් වන් තවත් අතුරු කතාන්දර ඇතැයි පෙනී යන්නේ එවිට ය.

එහි පළමුවැනි කථාව මෙසේ යයි දැක්විය හැක.

ඩී. එම්. ආනන්ද සමාන්‍ය මිනිසෙකුට උසුලාගෙන සිටීමට නොහැකි තරම් දරුණු වූ වධ බන්ධනවලට ලක්විය. ඩී.එම්. ආනන්ද රෝහණ සහෝදරයා සමග එක පෙළට තැබිය හැකි දක්ෂ කථිකයෙකුද, දක්ෂ සංවිධායකයෙකු ද, වෙහෙස නොබලා වැඩ කරන්නකු වුවද ඔහුගේ විප්ලවවාදී ජීවිතයේදී පොලිසියකින් හෝ බන්ධනාගාරයකින් ශාරීරික අඩමිතේට්ටම්වලට මුහුණ දී නොසිටියෙන් මෙවැනි වධවේදනාවෙන් වින්දිමට ප්‍රායෝගික අත්දැකීම් ලබා නොසිටියෙකු විය. එසේම ඔහු කාලයක් කිසිවකුගෙන් පරුෂ වචනයක්වත් නඳසු ශ්‍රමන ජීවිතයක් ගත කෙරුවෙකු බැවින් මෙම ශාරීරික වධවේදනා වලදී මානසිකව කඩා හැලෙන්නට ඇත.

තවත් අනුමාන මතයක් නම් රහස් තොරතුරු ලබාගත යුතු සිරකරුවන් ගැඹුරු නිද්‍රාවකට පත්වන එන්නතක් ලබා දී මෝහන වෛද්‍යවරයෙකු මගින් තොරතුරු ලබාගත් බවයි.

කෙසේ වුවද උපතිස්ස ගමනායක සහෝදරයා අල්ලා දීමට පැමිණියේ ඩී.එම්. ආනන්ද බවට ප්‍රබල සාක්ෂියක් තිබේ. ඒ ගමනායක සහෝදරයාගේ දරුවන් දෙදෙනාගෙන් අයෙකු ය.

-තරිටෙ තියන මාමා ආමි ජීප් එක ඇතුළේ හිටියා" ය යන්න එම සාක්ෂියයි. ඩී. එම්. ආනන්ද 1984 දී පමණ මාතර දිස්ත්‍රික්කය භාරව වැඩකළේ 'අමල්' නමිනි. එකල ද ඔහුගේ තරිටෙ පෑදී තිබූ බව මට මතක ය.

දෙවැනි කථාන්දරය තරමක් දීර්ඝ හා සංකීර්ණ එකකි.

පොදුවේ ගත්කල ලෝකයේ කිසිදු විප්ලවවාදී ව්‍යාපාරයක් එරටේ ඒකාධිපතියා, හෝ ධනපති පාලකයා සමග සම්බන්ධකම් පවත්වා නැත. වී. අයි. ලෙනින් සාර්ලා සමගත්, පිදෙල් කැස්ත්‍රෝ බැටිස්ටා සමගත් කිසිදු සම්බන්ධයක් පැවැත් වූ බවට ආරංචියක් නැත. -අප ධනේශ්වර පාලකයන් සමග අතරමග සාමදානයකින් සාකච්ඡාවකින්, සම්මුතියකින් නොර අනවරත අරගලයක් කරන්නෙමු." යි ප්‍රසිද්ධ මහජන රැස්වීම්වලදී ජ.වි.පෙ. පවසා ඇත්තේ ප්‍රතිඥා දී ඇත්තේ වරක් දෙවරක් නොවේ.

එහෙත් දේශපාලන උපක්‍රමයක් වශයෙන් හෝ වෙනත් කරුණක් මත හෝ ධනේශ්වරයේ පාලකයෙකු සමග ජ.වි.පෙ. සබඳතා පැවැත්විය. ඒ ආර්. ප්‍රේමදාස මහතා සමග ය. ආර්. ප්‍රේමදාස මහතා සමග සබඳතා නොපැවැත්වී යයි, සාකච්ඡා නොපැවැත්වී යයි ජ.වි.පෙ. ට කිව නොහැකි ය. පක්ෂය තහනම් කළ, පක්ෂයේ සාමාජිකයන් දරුණු ලෙස මර්ධනයට ලක්කරන ජේ. ආර්. කෙරෙහි ජ.වි.පෙ. තුල පැවතියේ තදබල වෛරයකි. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයෙන් අලවන ලද එක පෝස්ටරයක වූයේ 'ජේ. ආර්. මරමු' යන්න ය. ආර්. ප්‍රේමදාස අගමැතිවරයා ඉන්දියානු මැදිහත්වීමට විරෝධය දක්වන්නෙකු වූයෙන් ජ.වි.පෙ. ඔහු හැඳින්වූයේ දේශප්‍රේමියෙකු වශයෙනි. දේශප්‍රේමී අරගලය සඳහා තමන් සමග එක්වන කණ්ඩායම් අතර දේශප්‍රේමී ප්‍රේමදාස පිල ද සිටින බව දේ. ජ. ව්‍යාපාරයේ පෝස්ටර්වල ද සඳහන් විය. එසේම ජේ. ආර්. හා ඔහුගේ සහචරයෝ ජ.වි.පෙ. ත්‍රස්තවාදීන් ලෙස හඳුන්වදදී ආර්. ප්‍රේමදාස ජ.වි.පෙ. වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටියේ ය.

අධිකරණයකින් වැරදිකරුවකු කරන තුරු ජ.වි.පෙ. කිසිම චෝදනාවකට වැරදි කරුවකු නොවේ යයි ඔහු ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළේ ය.

"ජ.වි.පෙ. අනෙක් නායකයොත් මොහු වගේ නම් කොයිතරම් හොඳද ?" යනුවෙන් ප්‍රේමදාස මහතා පවසන ලද්දේ එම නිසාය. මේ සුහදශීලිකම උඩ ආනන්දගේ මතය වී ඇත්තේද ආර් ප්‍රේමදාස යනු විශ්වාසය තැබිය හැකි පුද්ගලයෙකු බවය.

ආර්. ප්‍රේමදාස මහතා සමග සාකච්ඡා කිරීමට පක්ෂය වෙනුවෙන් යවන ලද්දේ ඩී. එම්. ආනන්ද ය. මෙය එක් වරක් දෙවරක් පැවති සාකච්ඡාවක් නොව බොහෝ වාර ගණනක් පැවති සාකච්ඡා වටයකි. ආර්. ප්‍රේමදාස මහතා මියගිය පසුව ඔහුගේ ප්‍රවෘත්ති රාජ්‍ය ඇමතිව සිටි ඒ. ජේ. රණසිංහ මහතා 'දිවයින ඉරිදා සංගහ' සමග සාකච්ඡාවක් පවත්වමින් මෙසේ කියා සිටියි. සාකච්ඡාව පවත්වා ඇත්තේ 'ජටිල වැළිඳබඩ' මහතා ය.

"මම ජනාධිපතිතුමාට ඩී. එම්. ආනන්ද පිළිබව දැන්වූවා. ඩී. එම්. ආනන්ද තුළින් තමයි අපිට ප්‍රුළුවන් උනේ ජ.වි.පෙ. සටන් මධ්‍යස්ථානය මෙහෙය වූ බස් හා රෝහල් වර්ජනය වළක්වා ගන්න ඩී. එම්. ආනන්ද මට හඳුන්වා දුන්නේ රුක්මන් සේනානයක මහත්මයා. රුක්මන් මට ඔහු ගැන විස්තර කියපු දිනයේදී මම යම් ස්ථානයකට ගියා. එතැන ජ.වි.පෙ. ට සම්බන්ධ අය කිහිප දෙනෙක් හිටියා. සමහරු අව් කන්නාඩි පැළඳ ගෙන හිටියේ. රුක්මන් සහ මම මේ අය ජනාධිපති ප්‍රේමදාස මහතා වෙත රැගෙන ගියා. පසුව මම පමණක් කිහිප විටක්ම ඩී. එම්. ආනන්ද ජනාධිපතිවරයා වෙත ගෙන ගොස් තිබෙනවා. එහෙම ගිය එක දිනක පස්වරු 10.00 සිට පසු දින 5.00 වනතුරු සාකච්ඡා කළා. එහෙම කරලා තමයි වර්ජනය නැවැත්තුවේ. .....ජ.වි.පෙ. සමග සහයෙෂ්ගයෙන් ජාතික රජයක් ඇති කිරීමට ජනාධිපති ප්‍රේමදාස මහතාට ඒ දිනවල අවශ්‍යව තිබුණා. ජ.වි.පෙ. සාමාජිකයන් පිරිසකට කැබිනට් ඇමති පදවි ලබාදීමට පවා ඒ දිනවල සාකච්ඡා පැවැත්වෙමින් තිබුණා. නමුත් පසුව එම සාකච්ඡා බිඳ වැටුණා."

ආනන්ද - ප්‍රේමදාස හමුවෙන්, ආනන්ද ප්‍රේමදාසගේ ගිත්ගත් පුද්ගලයෙකු බවට පත්විය.

"ජ.වි.පෙ. අනෙක් නායකයොත් මොහු වගේ නම් කොයිතරම් හොඳද ?" යනුවෙන් ප්‍රේමදාස මහතා පවසන ලද්දේ එම නිසාය. මේ සුහදශීලිකම උඩ ආනන්දගේ මතය වී ඇත්තේද ආර් ප්‍රේමදාස යනු විශ්වාසය තැබිය හැකි පුද්ගලයෙකු බවය.

ජ.වි.පෙ. සමග කිසියම් සම්මුතියකට පැමිණ මේ අවදානම් තත්ත්වයෙන් මිදීමේ තදබල උවමනාවක් ආර් ප්‍රේමදාසයන්ට තිබිණි. පක්ෂයේ ප්‍රධාන ක්‍රියාකාරිකයන් හා නායකයන් හමුදා ග්‍රහණයට අසු වී කිසිම බුරුලක් නොලැබ ඝාතනය වෙන්ම, පරාජය වී යටත් වූවාය යන මතයක් ජනතාව අතර ඇති නොවන ආකාරයේ සම්මුතියකට එළඹීමට ජ.වි.පෙ. ට ද අවශ්‍ය වන්නට ඇත. ඩී. එම්. ආනන්ද, ප්‍රේමදාස ජනාධිපතිවරයා සමග සාකච්ඡා කළේ ඒ සඳහා නොවිය හැකිද ?

අවසානයේදී පක්ෂයේ ඉහළම නායකයන් අත්අඩංගුවට පත්වූයේ ඩී. එම්. ආනන්ද විසින් හුදකලාව ගනු ලැබූ තීරණයක් නිසාද, පක්ෂයේ අනුදැනුම මත ගනු ලැබූ යම් ක්‍රියා මාර්ගයක් කිසිසේත් බලාපොරොත්තු නොවූ ප්‍රතිඵලයක් අත්කර දුන් නිසාද යන්න ඉඳුරාම කිව නොහැක. හැක්කේ අනුමාන නිගමනයන්ට එළඹීම පමණි.

සුමිත් අතුකෝරළ හෙවත් නන්දසිංහ විජේනායක, ශාන්ත බණ්ඩාර, උපාලි ජයවීර ප්‍රමුඛ නායකයන් හමුදා ග්‍රහණයට අසු වී ඝාතනය වන විට, පක්ෂයේ දෙවැනි පෙළ නායකයන් ක්‍රියාධරයන් හා සාමාජිකයන් රටපුරාම පොග ගණනින් මරා දැමෙන විට, සංවිධාන ජාලය දිනෙන් දින දුර්වල වී අයාලේ යන විට මේ අරගලට තව දුරටත් ගෙන යාම නිරර්ථක ක්‍රියාවක් බැව් ඩී. එම්. ආනන්ද අවබෝධ කරගත්තා විය යුතුය.

ප්‍රධාන නායකයන් අත් අඩංගුවට ගැනීමට තමාට උදව් කළහොත් ඔවුන්ට පොදු සමාවක්ද දී, ජීවිත සුරක්ෂිත කොට, පක්ෂ තහනමද ඉවත් කොට නීත්‍යානුකූල දේශපාලනයේ යෙදීමට ඉඩ ප්‍රස්ථා සලස්වන්නෙමියි යන ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ පොරොන්දුව ඩී. එම්. ආනන්ද විශ්වාස කළා වන්නට ඇත. සිය බලය රැක ගැනීම සඳහා ඕනෑම නින්දිත, ඕනෑම දරුණු ඛිහිසුණු ක්‍රියාවක් කළහැකි වර්ගයේ චරිතයක් වන ප්‍රේමදාස ජනාධිපතිවරයා, ඩී. එම්. ආනන්ද තම ප්‍රයෝගයට අසු වී සිය නායකයන් පෙන්වා දුන් විට ඔහුද අතුළු සියලු දෙනාම විනාශ කිරීමේ නියෝගය දෙන්නට ඇතැයි සිතිය නොහැකිද?

තම නායකයන් පාවාදීම ඩී. එම්. ආනන්දගේ හුදකලා තීරණයක් නම් අපිට සිතිය හැක්කේ ඉහත කී ලෙසය.

නැතහොත් පක්ෂය උත්සහ කරන්නට ඇත්තේ ප්‍රේමදාස ජනාධිපතිවරයා යම් උපක්‍රමයකට හසුකර ගැනීම විය හැක. එහෙත් සිදුවූයේ එහි අනෙක් පැත්තදැයි එනම්, ප්‍රේමදාසගේ උගුලේ පක්ෂය අසුවීමදැයි යන සැකය බැහැර කළ හැක.

මහා බේදවාචකයකින් අවසන් වී පරාජයට පත් වුණු දැවැන්ත අරගලයක, 'ද්‍රෝහියෙකු' නොමැතිවීමේ හේතුව එවැන්නක් වීමට බැරි නැත.

මා කිසිදිනක මගේ රටහැර තොරටක යාම ප්‍රාර්ථනා කෙරුවෙකු නොවේ. එසේ වුවත් මම රට හැරදමා යමින් සිටින්නෙමි.

මුදල් උපයා ධනවතෙකු වී නවීන පන්නයේ විශාල නිවසක, මොටර් රථයක හිමිකරුවෙකු වී සුව පහසු ජීවිතයක් ගතකළ යුතු බව කෙදිනකවත් මගේ ජීවිතයේ ප්‍රාර්ථනා සිහින අතර නොවී ය.

මගේ එකම සිහිනය වූයේ මගේ පක්ෂය (ජ.වි.පෙ.) විසින් ගොඩ නගනු ලබන්නා වූ සමාජවාදී පාලනය ක්‍රමයකට උරදෙන හොඳ කොමියුනිස්ට් වාදියෙකු වී මගේ රට ගොඩ නගමින් පොදු සමාජයේම පොදු මිනිසෙක්ව සාමාන්‍යාත්මතාවයෙන් යුතු සාමූහික ජීවිතයක් ගත කිරීමට ය.

මගේ එකම සිහිනය තාවකාලිකව බිඳවැටී රට හැරදමා යමින් සිටින්නෙක් වුවද සමාජවාදී සමාජයක් පිළිබඳ බලාපොරොත්තුවක් බිඳකින් හෝ ක්ෂය වී නැත. එහෙත් ඒ සඳහා උපයෝගී කරගන්නා එක් ක්‍රියා මාර්ගයක් (මාදිලියක්) වන ආයුධ සන්නද්ධ අරගලයේ වලංගුභාවය ගැන විශ්වාසය නම් දියවී යමින් පවතියි.

20 වන පිටට